# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.06.27 පැය 1215 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1291/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**සමාජ මාධ්‍ය ජාලා උපයෝගී කර ගනිමින් සිදු කරනු ලබන විවිධ වූ අපරාධයන්ට ශ්‍රී ලාංකික පුරවැසියන් වින්දිතයන් වීම සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම.**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මෑත කාලීනව සිදු කරන ලද විමර්ශන වලදී Facebook, Whatsapp, Telegram, Skype, We chat ආදි සමාජ මාධ්‍ය ජාලා උපයෝගී කරගනිමින් සිදු කරනු ලබන අපරාධයන්ට ශ්‍රී ලාංකික පුරවැසියන් වින්දිතයන් වීමේ සීග්‍ර වර්ධනයක් ඇති බවට නිරීක්ෂණය වී ඇත.

අපරාධකරුවන් විසින් මෙවැනි වංචාවන් සිදු කිරීම සඳහා **ප්‍රධාන ක්‍රම වේද දෙකක්** භාවිතා කරනු ලබයි.

එහිදී **පළමු ක්‍රමය** ලෙස මුලින්ම ඉහත දක්වා ඇති සමාජ ජාලා ඔස්සේ නිවසේ සිට රැකියා ලබාගෙන විශාල මුදල් ප්‍රමාණයක් උපයාගත හැකි බවට දැන්වීම් පලකර යම් ව්‍යාපාරයකට මුදල් ආයෝජනයක් කරන ලෙසට දැනුම්දීමක් කරනු ලබයි. පලමු පියවර ලෙස මෙම අයෝජනය සඳහා සුළු මුදලක් තැන්පත් කරන ලෙසට අපරාධකරුවන් විසින් දැනුම් දී එම සුළු මුදල සඳහා ප්‍රතිලාභයක් වශයෙන් සාමාන්‍ය මුදල් ප්‍රමාණයක් ආයෝජනය කල මුදලට එකතු කර ලබාදීම සිදු කරනු ලබයි. මෙවැනි පියවරයන් කිහිපයකදී ආයෝජකයාට ප්‍රතිලාභ ප්‍රමාණ වැඩිකරමින් ලබාදෙනු ලබයි. එහිදී මෙම පුද්ලයන්ගේ විශ්වාසය දිනා ගැනීමට කටයුතු කර තවත් ආයෝජන අවස්ථා ඇති බව සඳහන් කරමින් විශාල ලෙස මුදල් ආයෝජනය කරන ලෙසට උපදෙස් ලබා දෙනු ලබයි. මේ ආකාරයෙන් මුදල් තැන්පත් කරවාගනු ලබන්නේ දේශීය බැංකු වල ඇති ගිණුම් වලට වේ.

ඒ අනුව වැඩි මුදල් ප්‍රමාණයන් අවස්ථාවන් කිහිපයකදී ඉහත පරිදි තැන්පත් කලද ඒ සඳහා ප්‍රතිලාභ ආයෝජකයින්ට ලබා නොදීම සිදුකරයි. මෙම ආයෝජකයන් ප්‍රතිලාභයන් ලබා නොදීම සම්බන්ධයෙන් අපරාධකරුවන්ගෙන් අදාල සමාජ ජාලා ඔස්සේ විමසීමේදී එම අපරාධකරුවන් දන්වා සිටින්නේ ප්‍රතිලාභ ලබා ගැනීමට අවශ්‍ය නම් ආරක්ෂක බදු, රේගු ගාස්තු වැනි ගාස්තු ගෙවිය යුතු බවත් ඒ සඳහා ද අමතර මුදල් යෙදවුවහොත් ප්‍රතිලාභය ලබා දිය හැකි බවයි.ඒ අනුව තව තවත් මුදල් ප්‍රමාණ ආයෝජනය කරන ලෙසට දැනුම් දෙනු ලබයි.

**දෙවැනි ක්‍රමය** ලෙස ඉහත සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ නිවසේ සිට රැකියා ලබාගෙන විශාල මුදල් ප්‍රමාණයක් උපයාගත හැකි බවට දැන්වීම් පලකර ඒ සඳහා සම්බන්ධ වන පුද්ගලයන්ගේ ගිණුම් අංකයන් ලබාගෙන එම ගිණුම් වලට බැර වන මුදල්

අපරාධකරුවන් විසින් සමාජ මාධ්‍ය ජාලා මඟින් දැනුම්දෙනු ලබන ගිණුම් වෙත හුවමාරු කරන ලෙසත් ඒ සඳහා ප්‍රතිලාභයක් වශයෙන් ගිණුමට තැන්පත් වන මුදලින් කොමිස් මුදලක් ගිණුම් හිමිකරුවන්ට ලබාදීම සිදු කරනු ලබයි. මෙම ක්‍රම වේදය ඔස්සේ ඉහත විස්තර කරන ලද පලමු ක්‍රමය මගින් තැන්පත් කරගන්නා මුදල් විශාල ගිණුම් ප්‍රමාණයක් භාවිතා කරමින් වෙනත් ගිණුම්වලට සංසරණය සිදු කරන බවට විමර්ශන නිලධාරීන් විසින් නිරීක්ෂණය කර ඇත.

ඒ අනුව මේ සඳහා ගොදුරුවන පුද්ගලයින් නොදැනුවත්වම කලු සල්ලි සුදු කිරීමේ මූලා වංචාවට හා අපරාධයකට ආධාර අනුබල දීමේ වරදට හසුවේ.

මෙම අපරාධයන් සිදු කරනු ලබන අපරාධකරුවන් මෙරට හෝ විදේශ රටවල සිටිමින් නවීන තාක්ෂණය භාවිතා කරමින් අන්තර්ජාලය භාවිතා කර සිදුකරනු ලබන බවට වැඩිදුරටත් විමර්ශනවලදී අනාවරණය වී ඇත.

Facebook, Whatsapp, Telegram, Skype, We chat යන සමාජ ජාලා වලින් සිදු කරනු ලබන අපරාධයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට විමර්ශකයන්ට ක්ෂණිකව නොහැකිවීම මත මෙම අපරාධකරුවන් අපරාධයන් සිදුකර නීතියේ රැහැනෙන් ගැලවී යන බවට නිරීක්ෂණය වේ. එබැවින් මෙවැනි අපරාධයන් වළක්වා ගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියන් දැනුවත් කිරීම ප්‍රධාන අවශ්‍යතාවයක් බවට විමර්ශන නිලධාරීන් හඳුනාගෙන ඇත.

එබැවින් සියලු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් සහ Facebook, Whatsapp, Telegram, Skype, We chat යන සමාජජාලා මඟින් විවිධ පුද්ගලයන් නමින් පෙනී සිටින ගිණුම් හරහා ලබාදෙනු ලබන දැන්වීම්, විවිධ වෙබ් අඩවි සඳහා පිවිසීමට ලබා දෙන අන්තර්ජාල දිගු (Link), නොදන්නා සමාජ ජාල සමූහ වෙත පිවිසීම හා ඒවා මගින් ලබාදෙන උපදෙස් අනුව කටයුතු නොකරන ලෙසත්, තම පුද්ගලික බැංකු ගිණුම් විස්තර නොදන්නා වෙනත් පාර්ශව වෙත ලබා නොදෙන ලෙසත්, නොහඳුනන පුද්ගලයන්ගෙන් තම ගිණුම් වෙත ලැබෙන මුදල් තෙවැනි පාර්ශව වල උපදෙස් පරිදි ඔවුන් විසින් ලබාදෙන වෙනත් ගිණුම් වෙත හුවමාරු කිරීම සිදු නොකරන ලෙසත් ඒ අනුව මෙම අපරාධයන් පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ලබාදීම තුලින් ශ්‍රී ලාංකික පුරවැසියන් දැනුවත් කරන ලෙසට කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**